සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

6 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 14 S

# කතෝලික ධර්මය

නම ..............................................

කාලය පැය දෙකයි

උපදෙස් : ★ ප්‍රශ්ණ සියල්ලටම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්ණයකට ලකුණු 02 බැගින් හිමිවේ.
★ අංක 01 - 10 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

01. ශු. බයිබලය තුළ අඩංගු වනුයේ,

1. ගැලවීමේ ඉතිහාසය යි. 2. දේව වචනය යි.
3. පංච පුස්තකය යි. 4. දේව මැවිල්ල යි.

02. විශ්වාසයේ හා බලාපොරොත්තුවේ පදනම වන්නේ,

1. ශු. බයිබලය යි. 2. නව ගිවිසුම යි.
3. පැරණි ගිවිසුම යි. 4. පංච පුස්තකය යි.

03. හේබ්‍රෙව් බසින් ටෝරා යනුවෙන් හඳුන්වනු ලබන්නේ,

1. ශු. බයිබලය යි. 2. නික්මයාම යි.
3. පංච පුස්තකය යි. 4. ඉශ්‍රායල් ජනතාව යි.

04. නික්මයාම පොතේ ප්‍රධාන චරිතය වනුයේ,

1. ආබ්‍රහම් තුමා ය. 2. ක්‍රිස්තුන් වහන්සේය.
3. ජාකෝබ් තුමා ය. 4. මෝසස් තුමා ය.

05. නව ගිවිසුමේ පළමු පොත් හතර හඳුන්වනු ලබන්නේ,

1. පංච පුස්තකය ලෙසය. 2. ශුභාරංචිය ග්‍රන්ථ ලෙසය.
3. ඉතිහාස පොත් ලෙසය. 4. දිවැසිවර ග්‍රන්ථ ලෙසය.

06. ජොහාන් සුබාරංචියේ සංකේතය වනුයේ,

1. රාජාලියා ය. 2. ගවයා ය.
3. මිනිසා ය. 4. සිංහයා ය.

07. දෙවියන් වහන්සේ මිනිසා හා සතුන් මවන ලද්දේ,

1. පළමුවන දවසේදී ය. 2. දෙවන දවසේදී ය.
3. හයවන දවසේදී ය. 4. හතරවන දවසේදී ය.

08. රෝම වැසියන්ගේ සංගණනයක් පැවැත්වීමට නියම කරන ලද අධිරාජ්‍යය වන්නේ,

1. පාරාවෝ අධිරාජ්‍යයා ය. 2. දාවිත් අධිරාජ්‍යයා ය.
3. සලමොන් අධිරාජ්‍යයා ය. 4. අගෝස්තුස් අධිරාජ්‍යයා ය.

09. ජේසුස් වහන්සේ උපත ලැබූ නගරය වනුයේ,

1. ගලීලය ය. 2. බෙත්ලෙහෙම ය.
3. ජෙරුසලම ය. 4. නාසරෙත් නුවර ය.

.

10. දොළොස් වියැති ජේසු කුමරු ජෙරුසලමට ගියේ කුමන මංගල්‍යය සැමරීම සඳහා ද?

1. පාස්කු මංගල්‍ය සැමරීමට ය. 2. කූඩාරම් මංගල්‍ය සැමරීමට ය.
3. කානික්ක මංගල්‍යය සැමරීමට ය. 4. පෙන්තකොස්ත මංගල්‍ය සැමරීමට ය.

(ල. 2 x 10 = 20)

**අංක 11 - 15 තෙක් ප්‍රශ්න සඳහා හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරා ලියන්න.**

| |
|---|
| නික්මයාම, මතෙව් සුබාරංචිය, දින 6 ක්, මාක්තුමා, ස්වරූපය හා සමානකම, ලුක්තුමාය. |

11. සුබාරංචියක් ලියූ එකම අන්‍ය ජාතිකයා ................................................................ ය.

12. ................................................................ පංච පුස්තකයට අයත් පොතකි.

13. දෙවියන් වහන්සේ ................................................................ තුළ ලෝකය මැවූ සේක.

14. ................................................................ නව ගිවිසුමට අයත් පොතකි.

15. දෙවියන් වහන්සේ තමන්ගේ ................................................................ අනුව මිනිසා මවනු ලැබීය. (ල. 2 x 5 = 10)

**අංක 16 - 20 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.**

16. ජුසේතුමා දාවිත්ගේ වංශයට හා පෙළපතට අයත් ය. ( )
17. දේව ජීවිතයට පංගුකාර වන්නේ මිනිසා පමණි. ( )
18. ජේසුස් වහන්සේ ප්‍රඥා මහිමයෙන් හා කාය ශක්තියෙන් වර්ධනය වූ බව මාක්තුමා පවසයි. ( )
19. ජුදෙව්වරුන්ට රජව උපන් උතුමාණෝ කොතැන්හි ද යනුවෙන් පැවසුයේ දාවිත් රජතුමාය. ( )
20. සෙබදි හා සලෝමිගේ පුත්‍රයා ජොහන්තුමාය. ( )

(ල. 2 x 5 = 10)

## II කොටස

**පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01.
1. නව ගිවිසුමේ පොත් දෙකක් නම් කරන්න.
2. පංච පුස්තකයේ අඩංගු පොතේ දෙකක් නම් කරන්න.
3. උප්පත්ති පොතේ අඩංගු කරුණු දෙකක් ලියන්න.
4. ශු. ලූක්තුමා පිළිබඳව සුවිශේෂී කරුණු දෙකක් ලියන්න.
5. දෙවියන් වහන්සේ හතරවන දිනයේ දී මැවූ මැවිලි දෙකක් නම් කරන්න.
6. දෙවියන් වහන්සේ මිනිසා මවා මිනිසාට පැවරූ වගකීම් දෙකක් ලියන්න.
7. ජුසේතුමා අයත් වූ වංශය හා පෙළපත ලියන්න.
8. ජේසුස් වහන්සේ වර්ධනය වූ ආකාර දෙකක් ලියන්න.
9. ලූක් හා මාක් ශුභාරංචියේ සංකේත පිළිවෙලින් ලියන්න. (ල. 2 x 10 = 20)
10. ජුදා ජාතිකයන්ගේ ආගමික හා ජාතික චාරිත්‍ර දෙකක් ලියන්න.

02.
1. පංච පුස්තකය හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න. (ල. 2)
2. නික්මයාම පොතේ සඳහන් කරුණු තුනක් ලියන්න. (ල. 3)
3. මෝසස්තුමාගේ ජීවිතයෙන් ගත හැකි ආදර්ශ 5 ක් ලියන්න. (ල. 5)

03.
1. පැරණි ගිවිසුමේ හා නව ගිවිසුමේ පොත් ගණන වෙන වෙනම ලියන්න. (ල. 2)
2. ශුභාරංචි ග්‍රන්ථ තුනක් නම් කරන්න. (ල. 3)
3. පහත අවස්ථාවලදී ඔබ අන් අයට සුබාරංචියක් වන ආකාරය ලියන්න.
   - ❖ පන්තියේ කොන්වී සිටින මිතුරෙකුට
   - ❖ පාඩම් කටයුතු අපහසු සිසුවෙකුට
   - ❖ දෙමාපියන් අහිමි මිතුරෙකුට
   - ❖ නිතරම වැරදි ක්‍රියා කරන සිසුවෙකුට
   - ❖ ගුරුවරුන්ට අකීකරු සිසුවෙකුට

(ල. 5)

04. 1. දෙවියන් වහන්සේ ආදි මව්පියන් පදිංචි කළ උයන නම් කරන්න. (ල. 2)

2. මිනිසා දේව මැවිල්ල විනාශ කරන අවස්ථා තුනක් ලියන්න. (ල. 3)

3. දේව මැවිල්ල රැකගැනීමට ඔබට කළ හැකි කාර්යයන් පහක් ලියන්න. (ල. 5)

05. 1. දෙවියන් වහන්සේගේ .................................. තුළින් මනුෂ්‍යයා .................................. පුද්ගලයෙක් විය.
හිස්තැන් පුරවන්න. (ල. 2)

2. මිනිසා අන් මැවිලිවලට වඩා උසස්වීමට හේතු තුනක් ලියන්න. (ල. 3)

3. පුද්ගල හැකියා විවිධ ය. විවිධ පුද්ගල හැකියාවන් සේවය සඳහා යොදවන ආකාර පහක් ලියන්න.
(ල. 5)

06. 1. "මට පුරුෂයකු නැති බැවින් මෙවැන්නක් කෙසේ සිදුවිය හැකි ද?" මෙසේ පවසන්නේ කවුරුන් ද?
කා හට ද? (ල. 2)

2. ශාස්ත්‍රවන්තයන් තිදෙනා ජේසු කුමරුන්ට පුද කිරීමට රැගෙන ආ ද්‍රව්‍යයන් තුන නම් කරන්න.
(ල. 3)

3. සාමයෙන් සමගියෙන් ජීවත්වීමට නිවසේ දී හා පාසලේ දී ඔබට කළ හැකි කාර්යයන් පහක් ලියන්න.
(ල. 5)

# පළමු වාර පරීක්ෂණය - 2019

## 6 ශ්‍රේණිය කතෝලික ධර්මය (පිළිතුරු පත්‍රය)

## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 06. | 1 | 11. | ලූක් තුමා | 16. | ✓ |
| 02. | 1 | 07. | 3 | 12. | නික්මයාම | 17. | ✓ |
| 03. | 3 | 08. | 4 | 13. | දින හයක් | 18. | × |
| 04. | 4 | 09. | 2 | 14. | මතෙව් ශුභාරංචිය | 19. | × |
| 05. | 2 | 10. | 1 | 15. | ස්වරූපය හා සමානකම | 20. | ✓ |

(ල. 2 x 20 = 40)

## II කොටස

01.1. ශු. මතෙව්, ශු මාතෙව්, ශු. ජොහාන් ....... ආදි පොත් 27 න් දෙකක් ලියා තිබිය යුතුයි. (පිටු අංක 03)

2.
- ❖ උප්පත්ති පොත
- ❖ නික්මයාම පොත
- ❖ ලෙවි ව්‍යවස්ථාව
- ❖ ගණන් කථාව
- ❖ ද්විතීය නීති සංග්‍රහය

3.
- ❖ දෙවියන් වහන්සේ විශ්වය හා මිනිසා මැවීම
- ❖ ආදම් හා ඒවා පාපයට වැටීම
- ❖ කායින් හා ආබෙල් පිළිබඳ කතා පුවත
- ❖ නෝවා හා ජල ගැල්ම
- ❖ මිනිසා ඉදිකළ බාබෙල් කොත

(පිටු අංක 06)

4.
- ❖ ක්‍රිස්තුන් වහන්සේගේ අපෝස්තුලුවරයෙක් නොවේ.
- ❖ එතුමා වෛද්‍යවරයෙකි/ ඉතිහාසඥයකි/ චිත්‍ර ශිල්පියෙකි.
- ❖ ශුභාරංචියක් ලියන ලද එකම අන්‍ය ජාතිකයාය.

(පිටු අංක 09)

5.
- ❖ ඉර, හඳ හා තාරකා

6.
- ❖ දරු සම්පත් ලැබීමට.
- ❖ මැවිල්ල පාලනය කිරීම හෙවත් රැක ගැනීම
- ❖ පොළොව පුරා පැතිර යාමට
- ❖ පොළොව වගා කිරීමට
- ❖ වගාවෙන් ලැබෙන අස්වැන්න ප්‍රයෝජනයට ගැනීමට

7.
- ❖ ජුදා වංශය/ දාවිත්ගේ පෙළපත

8.
- ❖ ප්‍රඥා මහිමයෙන්
- ❖ කාය ශක්තියෙන්
- ❖ දෙවියන්ගේ ප්‍රසාදය ලබමින්
- ❖ මිනිසුන්ගේ ප්‍රසාදය ලබමින්

9.
- ❖ ලූක් - ගවයා
- ❖ මාක් - සිංහයා

10.
- ❖ අටවන දින චර්මඡේදනය කිරීම
- ❖ නම් තැබීම
- ❖ පිරිසිදු වීමේ පිළිවෙත් සිදු කිරීම
- ❖ කුළුඳුල් දරුවන් දෙවියන් වහන්සේට කැපකිරීම

(ල. 2 x 10 = 20)

02.

1.
- ❖ ව්‍යවස්ථාවලිය
- ❖ මෝසෙස් තුමාගේ ව්‍යවස්ථාව
- ❖ නීතිය
- ❖ මෝසෙස් තුමාගේ නීතිය

(ල. 2)

2. ❖ පාරාවෝ රජතුමා ඉශ්‍රායෙල් ජනතාවට හිරහැර කිරීම
❖ ඉශ්‍රායෙල් ජනතාව පොරොන්දු දේශයට ගෙනයාම
❖ සිනයි කන්දේ දී දස පනත ලබා දීම (පිටු අංක 06 ල. 5)
❖ මෝසෙස් තුමාගේ දූත මෙහෙවර

3. ❖ දෙවියන් වහන්සේගේ වචනයට කීකරු වීම
❖ අභියෝග භාර ගැනීම
❖ එඩිතර නායකයකු වීම
❖ ජනතාවට සැබෑ දිවැසිවරයෙක් ලෙස කටයුතු කිරීම
❖ නිසි ලෙස තම වගකීම ඉටු කිරීම (ල. 2 + 3 + 5 = 10)
දෙවියන් වහන්සේ කෙරෙහි අචල විශ්වාසය තැබීම (ල. 5)

03. 1. ❖ පැරණි ගිවිසුම - 46
❖ නව ගිවිසුම - 27 (ල. 2)

2. ❖ ශු. මතෙව් ශුභාරංචිය
❖ ශු. මාක් ශුභාරංචිය
❖ ශු. ලූක් ශුභාරංචිය
❖ ශු. ජොහාන් ශුභාරාංචිය (ල. 3)

3. ❖ පන්තියේ කොන් වී සටින මිතුරෙකුට - ඔහුට හොඳ මිතුරෙකු වීම.
❖ දෙමාපියන් අහිමි මිතුරෙකුට - ඔහුට අවශ්‍යතා වෙනුවෙන් උපකාර කිරීම
❖ ගුරුවරුන්ට අකීකරු සිසුවෙකුට - තම වැරදි ක්‍රියා පිළිබඳ පැහැදිලි කර දීම.
❖ පාඩම් කටයුතු අපහසු සිසුවෙකුට - නොදන්නා දේ කියා දීම, පාඩම් කටයුතු සඳහා උදව්වීම.
❖ නිතරම වැරදි ක්‍රියා කරන සිසුවෙකුට - යහපත් ක්‍රියාවන් සඳහා ඔහු/ ඇය හවුල්කර ගැනීම, අයහපතින් වැළකී සිටීමට උදව් කිරීම.

**(ආදී සිසුවා ලියා ඇති පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න.)** (ල. 5)
(ල. 2 + 3 + 5 = 10)

04.

1. ❖ ඒදන් උයන (ල. 2)
2. ❖ ගස් කැපීම, පරිසරය අපවිත්‍ර කිරීම, පොලිතීන් භාවිතය, වායු දූෂණය, ජල දූෂණය (ල. 3)
3. ❖ ගස් සිටුවීම, කැලි කසල ක්‍රමවත්ව බැහැර කිරීම, පොලිතීන් භාවිතය අවම කිරීම, දේව මැවිල්ලට ආදරය කිරීම, ජල සම්පත සුරැකීම, සත්ත්ව සම්පත සුරැකීම...... ආදී පිළිතුරු (ල. 5)

05.
1. ❖ ජීවන හුස්ම/ ජීවමාන (ල. 2)
2. ❖ දේව ස්වරූපය හා සමානකම
❖ මනුෂ්‍යයා මවා ඔහුගේ නාස් පුඩු තුළට ජීවන හුස්ම හෙළීම
❖ මිනිසා මැවූ දිනය "ඉතා මනහර" බව ප්‍රකාශ කිරීම
❖ මිනිසා සතුන්ට නම් කිරීම (පිටු අංක 23) (ල. 3)
3. ❖ ගුරු වෘත්තිය සඳහා ❖ කුඹල් කර්මාන්තය සඳහා
❖ වෛද්‍ය වෘත්තිය සඳහා ❖ පරිගණක කටයුතු සඳහා
❖ ධීවර ❖ ගොවිතැන් කටයුතු සඳහා (පිටු අංක 24) (ල. 5)

06.
1. ❖ මරිය තුමිය විසින් ගාබ්‍රියල් දේව දූතයා හට (ල. 2)
2. ❖ රන්ද/ තුවරලාද/ ගන්ධරස (ල. 3)
3. ❖ අන්මත වලට ගරු කිරීම (ල. 3)
❖ බෙදා හදා ගැනීම
❖ ඉවසීමෙන් කටයුතු කිරීම
❖ නායකත්වයට ගරු කිරීම (ල. 5)
❖ සහයෝගයෙන් කටයුතු කිරීම........ ආදී පිළිතුරු (2 + 3 + 5 = 10)